# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
## பௌத்த மத அலுவல்கள் திணைக்களம்
## DEPARTMENT OF BUDDHIST AFFAIRS

"දහම්පාය", අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.
"தஹம்பாய" இல. 135, ஸ்ரீமத் அனகாரிக்க தர்மபால மாவத்தை, கொழும்பு 07.
"Dahampaya" No. 135, Srimath Anagarika Dharmapala Mawatha, Colombo 07.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල, මහනුවර.
பிராந்திய அலுவலகம், மாவட்ட செயலகக் கட்டிடம், கண்டி.
Regional Office, District Secretariat Building, Kandy.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල, රත්නපුර.
பிராந்திய அலுவலகம், மாவட்ட செயலகக் கட்டிடம், இரத்தினபுரி.
Regional Office, District Secretariat Building, Ratnapura.


| මගේ අංකය / எனது இல. / My No. | චක්‍රලේඛ අංක 2026 – DBA/04/02/03 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2026.07.14 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
.......................................

**<u>සිවුරු/ අටපිරිකර/ පූජා භාණ්ඩ හා අලෙවි ආයතන ප්‍රමිතිගත කිරීම.</u>**

සිවුරු, අටපිරිකර, පූජා භාණ්ඩ අලෙවි කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳව 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) හා 10(1)(ආ)(ii) වගන්ති යටතේ නිකුත් කර ඇති විධාන අංක 55 හා 54 ඇතුළත් 2015.06.11 දිනැති අංක 1918/20 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර දෙක කෙරෙහි අවධානය යොමුකරමින් අටපිරිකර ඇතුලු පූජා භාණ්ඩ නිෂ්පාදනයේ දී හා අලෙවි කිරීමේ දී අදාළ විධිවිධාන අනුගමනය කරනු ලබන්නේ ද යන්න පිළිඳවත් විශේෂයෙන් ශාසනික වශයෙන් ඉතා වැදගත් බුදු පිළිම, වටාපත් වැනි පූජා භාණ්ඩ අලෙවි කිරීමේ දී පබළු, දිලිසෙන අයිතම හා නොගැලපෙන වර්ණ සහිත මෝස්තර යොදා ගැනීම පිළිබඳව විශේෂ අවධානය යොමු කොට පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරවන ලෙස කාරුණිකව දන්වමි.

I. අටපිරිකර / සිවුරු අලෙවි කිරීම හා නිෂ්පාදනය කිරීමේ දී ඒ පිළිබඳ නිකුත් කර ඇති පාරිභෝගික සේවා අධිකාරී විධිවිධාන එලෙස ම අනුගමනය කිරීම.

II. අටපිරිකරක අඩංගු වියයුතු මූලික පිරිවිතර
   1) දෙපොට සිවුර - (දෙපට සිවුරේ පළල අඟල් 102 හා උස අඟල් 83)
   2) තනිපොට සිවුර - (තනිපට සිවුරේ පළල අඟල් 102 හා උස අඟල් 83)
   3) අඳනය - (අඳනයේ පළල අඟල් 79 හා උස අඟල් 43)
   4) බඳ පටිය - සිවුරේ රෙද්දේ වර්ණයෙන් නිම කළ යුතුය.
   5) පෙරහණ්කඩය - මෙහි වර්ණය සුදු විය යුතුය. එය ගොට්ටක් ආකාරයට මසා තැබිය යුතුය.
   6) ඉදිකටුව, නූල් පන්දුව (බෝලේ) - ඉදිකටුව සිවුරු සඳහා භාවිතයට සුදුසු ප්‍රමාණයෙන් තිබීම හා නූල් පන්දුවේ (බෝලේ) දිග 18 m හෝ ඊට වැඩි විය යුතුය. නූල් පන්දුවේ (බෝලේ) වර්ණය සිවුරේ වර්ණයට ගැලපෙන පරිදි විය යුතුය.
   7) දැලි පිහිය - (රේසර් යොදාගත නොහැක)
   8) පාත්‍රය - පාත්‍රය නිර්මිත ලෝහය හා ප්‍රතික්‍රියා කරන අහිතකරවන ආහාර වර්ග වේ නම් ඒ බව සටහන් කළ යුතුය.

III. අටපිරිකර සැදැහැවත් බෞද්ධයන් ඉතා ගෞරවයෙන් සලකන පූජා භාණ්ඩයක් බැවින් එය අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනයට තැබීමේ දී අගෞරවයක් ඇති නොවන පරිදි ප්‍රදර්ශනයට තැබීම.

IV. අටපිරිකර හා වෙනත් පූජා භාණ්ඩවලට අමතරව ව්‍යාපාරික අරමුණු මූලික කරගනිමින් වර්තමාන වෙළඳ පොලේ පවතින දොළොස් පිරිකර, සොළොස් පිරිකර ආදි විනයානුකූල නොවන පිරිකර අලෙවිය නතර කිරීම.

V. අටපිරිකර විනිවිද පෙනෙන සේ සෙලෝපෙන් කොලවලින් පමණක් ආවරණය කොට තැබීම.

VI. අටපිරිකර ඇතුළත කාඩ්බෝඩ් නොයෙදීම.

VII. ස්වාමින් වහන්සේලාගේ පරිහරණයට නුසුදුසු රෙදි වර්ග හෝ නිසි දිග පළල නොමැති සිවුරු හා අඳන අලෙවි නොකිරීම.


| කොමසාරිස් ජනරාල් / ஆணையாளர் நாயகம் / Commissioner-General | ෆැක්ස් / தொலைநகல் / Fax | කාර්යාලය - පොදු / அலுவலகம் - பொது / Office-General | මහනුවර කාර්යාලය / கண்டி அலுவலகம் / Kandy Office | රත්නපුර කාර්යාලය / இரத்தினபுரி அலுவலகம் / Ratnapura Office |
|---|---|---|---|---|
| 011-2337350 | 011-2337355 | 011-2307674, 011-2307694 | 081-2225152 | 045-2222637 |

www.dba.gov.lk
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs
dba.gov.lk@gmail.com

VIII. පරිහරණය කරන ලද අඳන, සිවුරු, මල බැඳුනු පාත්‍රා, දැලිපිහි,ඉඳිකටු ආදී දෑ අටපිරිකරවල යොදා අලෙවි නොකිරීම.

IX. අටපිරිකර ලෙස හෝ එහි අයිතමයන් වෙන්ව හෝ අලෙවි කරයි නම් නිෂ්පාදනයේ දී නිෂ්පාදකගේ අනන්‍යතාව දැක්වීම සඳහා නම, ලිපිනය හා දුරකතන අංකය සඳහන් කුඩා ලේබලයක් යෙදීම.

X. අටපිරිකර, සිවුරු ඇතුළු සියලුම පූජාභාණ්ඩවල මිල පාරිභෝගිකයාට පෙනෙන ලෙස ප්‍රදර්ශනය කිරීම.

XI. බුදු පිළිම හා වටාපත් ආදී සෙසු පිරිකර හා පූජාභාණ්ඩ අලෙවි කිරීමේ දී ඒවායේ ගෞරවයට හානිවන පරිදි රේන්ද/පබලු ඇල්ලීම හා මෝස්තර භාවිතා නොකිරීම.

ඉහත කරුණු උල්ලංඝනය කරන යම් පුද්ගලයෙකු හෝ ව්‍යාපාරික ස්ථානයක් වේ නම් නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත් තවදුරටත් එම කාර්යයන් උල්ලංඝනය කරයි නම් ඔහුගේ / ඇයගේ හෝ ව්‍යාපාරික ස්ථානයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබිය යුතුය.

මේ පිළිබඳව ඔබගේ කාරුණික අවධානය යොමුකර ඉහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන අටපිරිකර අලෙවිකරන ස්ථාන නියාමනය සඳහා සුදුසු වැඩපිළිවලක් සකස් කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

මේ සම්බන්ධයෙන් ඔබ ලබාදෙන සහයෝගය පිළිබඳව අතිශය අගය කරමි.

ආර්.එම්.පී.සේනාරත්න,
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

දුරකතන අංකය - 011-3159683
ෆැක්ස් අංකය - 011-2337355
විද්‍යුත් ලිපිනය - buddhistaffairs1@gmail.com

පිටපත්

01. සියලුම නිකාය පාර්ශ්ව මහා ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත - අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලා දැනුවත් කිරීමට හා අවශ්‍ය කටයුතු සඳහා ගෞරවයෙනි.
02. සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ ගරු ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ වෙත ගෞරවයෙනි - ( සියලුම ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලවල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා දැනුවත් කර විනයානුකූල නොවන පිරිකර පූජාකිරීම හා පිළිගැනීම පිළිබඳව දායක පින්වතුන් දැනුවත් කිරීම සඳහා ගෞරවයෙනි)
03. බුද්ධශාසන සභාවේ ගරු ලේකම්,සභාපති ස්වාමීන් වහන්සේලා - අවශ්‍ය කටයුතු සඳහා ගෞරවයෙනි
04. බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය තුමා - කරු.දැන ගැනීම සඳහා
05. ලේකම්, බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - කරු.දැන ගැනීම සඳහා
06. සභාපති, පාරිභෝක සේවා අධිකාරිය - කරු.දැන ගැනීම සඳහා සහ නිලධාරීන් දැනුවත් කොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා
07. අධ්‍යක්ෂක ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය - කරු.දැන ගැනීම සඳහා සහ නිලධාරීන් දැනුවත් කොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා
08. සියලුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත - කරු.දැන ගැනීම සඳහා

(1)

128

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/20 - 2015 ජූනි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2015.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක. 55.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10(1)(අ) වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියාකරමින්, පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ විකිණීමේදී හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමේදී හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේදී අදාළ භාණ්ඩයේ හෝ ඇසුරුමෙහි පැහැදිලි ලෙස පහත සඳහන් තොරතුරු අඩංගු විය යුතු බවට අදාළ භාණ්ඩ නිෂ්පාදකයින් හා වෙළෙඳුන් වෙත මෙයින් විධාන කරනු ලැබේ.

1. භාණ්ඩයේ උපරිම සිල්ලර මිල
2. නිෂ්පාදකයාගේ හෝ ආනයනකරුගේ ලිපිනය හා දුරකථන අංකය
3. නිෂ්පාදිත දිනය

ඉහත සඳහන් උපලේඛනය

- i. අටපිරිකර
- ii. තනිපට සිවුර, දෙපට සිවුර සහ අඳනකඩය
- iii. පාත්‍රය
- iv. බඳ පටිය

මෙම විධානය වර්ෂ 2015 නොවැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 ජූනි මස 01 වැනි දින,
...දී ය.

06 - 762

EA - PG 2506 — 206 (2015/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

... www.documents.gov.lk ...

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1918/21 - 2015 ජූනි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2015.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක. 54.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

10(1)(ආ)(ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ නිෂ්පාදකයින් හා වෙළෙඳුන් විසින් සිය ආයතනය/වෙළෙඳසැල බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළයුතු බවටත් එසේ ලියාපදිංචි කළ බවට නිකුත් කරන ලද සහතිකය සිය ආයතනයෙහි / වෙළෙඳසැලෙහි ප්‍රකටව පෙනෙනා කොට්ඨාසක හෝ / ස්ථානයක ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය බවටත් මෙයින් විධානය කරනු ලැබේ.

ඉහත සඳහන් උපලේඛනය

i. අටපිරිකර
ii. තනිපට සිවුර, දෙපට සිවුර සහ අඳනකඩය
iii. පාත්‍රය
iv. බඳ පටිය

මෙම විධානය වර්ෂ 2015 නොවැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06 - 761